# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2007 අංක 56 දරන සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (අයි.සී.සී.පී.ආර්.) පනත

---

[**සහතිකය සටහන් කළේ 2007 නොවැම්බර් මස 16 වන දින**]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---


2007 නොවැම්බර් මස 16 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ **:** රු. 6.00 යි. තැපැල් ගාස්තුව **:** රු. 5.00 යි.

## 2007 අංක 56 දරන සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (අයි. සී. සී. පී. ආර්.) පනත

[සහතිකය සටහන් කළේ 2007 නොවැම්බර් මස 16 වන දින]

එල්.ඩී.—ඕ. 30/2007.

**සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ (අයි. සී. සී. පී. ආර්) ව්‍යවස්ථාමය පියවර මගින් පිළිගැනීමක් ලබා දී නැති මානව හිමිකම්වලට අදාළ ඇතැම් ව්‍යවස්ථා බලාත්මක කිරීම සඳහා ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනතකි.**

පූර්විකාව.

1966 දෙසැම්බර් මස 16 වන දින එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබ 1976 මාර්තු මස 23 වන දින බලාත්මක වූ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියට ශ්‍රී ලංකාව රාජ්‍ය පාර්ශ්වයක් වන හෙයින් ද :

ඉහත කී සම්මුතියට ශ්‍රී ලංකාව විසින් 1980 ජුනි මස 11 වන දින එකඟත්වය දෙන ලද හෙයින් ද :

ඉහත කී සම්මුතියේ සඳහන් සිවිල් හා දේශපාලන අයිතිවාසිකම්වලින් සැලකිය යුතු ප්‍රමාණයකට ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මෙන්ම පාර්ලිමේන්තුව විසින් පනවන ලද වෙනත් නීතිවල ද ව්‍යවස්ථාමය පිළිගැනීමක් ලබා දී ඇති හෙයින් ද :

මෙතෙක් ප්‍රමාණවත් ලෙස ව්‍යවස්ථාමය පිළිගැනීමක් ලබා දී නැති ඉහත කී සම්මුතියේ සඳහන් සිවිල් හා දේශපාලන අයිතිවාසිකම්වලට උචිත නීති සම්පාදනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ රජයට අවශ්‍ය වී ඇති හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

**1**. මේ පනත 2007 අංක 56 දරන සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (අයි.සී.සී.පී.ආර්.) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

නීතිය ඉදිරියේ තැනැත්තකු ලෙස පිළිගැනීමට ඇති අයිතිය.

**2**. සෑම තැනැත්තකුටම නීතිය ඉදිරියේ තැනැත්තකු ලෙස පිළිගනු ලැබීමේ අයිතිය ඇත.

කිසිම තැනැත්තකු විසින් යුද්ධය පැතිරවීම නොකළ යුතු බව.

**3**. (1) කිසිම තැනැත්තකු විසින්, යුද්ධය පැතිරවීම හෝ වෙනස් ලෙස සැලකීමට, එදිරිවාදිකම්වලට හෝ ප්‍රචණ්ඩ ක්‍රියාවලට යොමු කිරීම සංයුක්ත වන ජාතික, වාර්ගික හෝ ආගමික වෛරය සඳහා පෙළඹවීම්, නොකළ යුතු ය.

2—PL 002500—3,600 (2007/10)

(2) (1) වන උපවගන්තියේ සඳහන් වරදක්—

(අ) සිදු කිරීමට තැත් කරන ;

(ආ) සිදු කිරීමට ආධාර හෝ අනුබල දෙන ; හෝ

(ඇ) සිදු කරන බවට තර්ජනය කරන,

සෑම තැනැත්තෙක්ම, මේ පනත යටතේ වූ වරදකට වරදකරු වන්නේ ය.

(3) මේ වගන්තියේ (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය යටතේ වරදක් සිදු කර ඇති බවට තීරණය කරනු ලබන තැනැත්තකු මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබීමේ දී, බරපතල වැඩ ඇතිව අවුරුදු දහයකට වැඩි නොවන කාලයක් සඳහා බන්ධනාගාරගත කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ වූ වරදක් සංඥෙය සහ ඇප දිය නොහැකි වරදක් විය යුතු අතර, එවැනි වරදක් සිදුකර ඇති බවට සැක කරනු ලබන හෝ චෝදනා ලැබ සිටින කිසිම තැනැත්තකු විශේෂ අවස්ථානුගත කරුණුවල දී මහාධිකරණය විසින් හැර, ඇප මත මුදා හරිනු නොලැබිය යුතු ය.

(5) මේ වගන්තිය යටතේ වූ වරදක් සිදු කිරීම සඳහා යම් තැනැත්තකුට එරෙහිව මහාධිකරණය විසින් පවත්වනු ලබන නඩු විභාගයක් එම අධිකරණයේ වෙනත් නීති කෘත්‍යයකට පෙර විභාගයට ගත යුතු අතර, වාර්තාගත කළ යුතු නොවැලැක්විය හැකි හේතු අනුව මිස, දිනපතා පැවැත්වෙන නඩු විභාගයක් ලෙස පවත්වාගෙන යා යුතු ය; තව ද එම නඩු විභාග කල් දැමීම ද නොකළ යුතු ය.

(6) මේ වගන්තියේ (2) වන උපවගන්තියේ කාර්ය සඳහා "අනුබලදීම" යන්නට දණ්ඩ නීති සංග්‍රහයේ 100 වන වගන්තියේ ඊට දී ඇති අර්ථයම තිබිය යුතු ය.

වරදක් සිදු කළ බවට චෝදනා ලැබ ඇති තැනැත්තකුගේ අයිතිවාසිකම්.

4. (1) යම් ලිඛිත නීතියක් යටතේ සාපරාධී වරදක් පිළිබඳව චෝදනා ලැබ සිටින තැනැත්තකුට—

(අ) තමා ඉදිරිපිටදීම නඩු විභාගය පැවැත්වීමේ අවස්ථාවක් ලබා ගැනීමට ;

(ආ) තමා වෙනුවෙන් තමාම පෙනී සිටිමින් විත්තිවාචක ඉදිරිපත් කිරීමට හෝ තමා විසින් තෝරාගනු ලබන නීති ආධාර ලබමින් විත්තිවාචක ඉදිරිපත් කිරීමට සහ ඔහුට එවැනි ආධාරයක් නොමැති විට, එම අයිතිය පිළිබඳව දැන ගැනීමට ;

(ඇ) යුක්තිය සාධාරන ලෙස ඉටුවීම සඳහා අවශ්‍ය වන අවස්ථාවක, උචිත නඩුවල දී ඔහුට නීති ආධාර ලබාදීමට සහ එම ආධාර සඳහා ගෙවීම් සිදු කිරීමට ඔහු වෙත ප්‍රමාණවත් මුදල් නොමැතිවිට, මුදල් ගෙවීමකින් තොරව ඔහුට එම නීති ආධාර ලබා ගැනීමට ;

(ඈ) ඔහුට විරුද්ධව ඇති සාක්ෂිකරුවන්ගෙන් ප්‍රශ්ණ ඇසීමට හෝ ප්‍රශ්න ඇසීමට සැලැස්වීමට සහ ඔහුට එරෙහිව සාක්ෂිකරුවන් කැඳවූ කොන්දේසි මතම ඔහු වෙනුවෙන් සාක්ෂි දෙන සාක්ෂිකරුවන් ද කැඳවීමට ;

(ඉ) නඩු විභාගය පවත්වන භාෂාව චූදිත තැනැත්තාට තේරුම් ගැනීමට හෝ කථා කිරීමට නොහැකි අවස්ථාවක, භාෂණ පරිවර්තකයකුගේ සේවය ලබාගැනීමට ; සහ

(ඊ) තමාටම විරුද්ධව සාක්ෂි දීමට හෝ වරද පිළිගැනීමට බලකරනු නොලැබීමට,

හිමිකමක් ඇත.

(2) යම් ලිඛිත නීතියක් යටතේ සාපරාධී වරදකට වරදකරු වන සෑම තැනැත්තකුටම, එවැනි වරදකරු කිරීමකට සහ පනවනු ලබන දණ්ඩනයකට එරෙහිව ඉහළ අධිකරණයකට අභියාචනය කිරීමේ අයිතියක් තිබිය යුතු ය.

(3) යම් සාපරාධී වරදක් සඳහා නීතියට අනුව දැනටමත් වැරදිකරු කරනු ලැබ ඇති හෝ නිදහස් කරනු ලැබ ඇති කිසිම තැනැත්තකුට, එම වරද සඳහාම නැවත නඩු විභාග කිරීම හෝ දඬුවම් පැමිණවීම නොකළ යුතු ය.

**5**. (1) සෑම ළමයකුට ම—

ළමයකුගේ අයිතිවාසිකම්.

(අ) ඔහුගේ හෝ ඇයගේ උපත ලියාපදිංචි කරවා ගැනීමට සහ ඔහුගේ හෝ ඇයගේ උත්පත්තියේ දින සිට නමක් දැරීමට ;

(ආ) ජාතිකත්වය ලබා ගැනීමට ;

(ඇ) හිංසා කරනු ලැබීමෙන්, නොසලකා හරිනු ලැබීමෙන්, අපයෝජනය කරනු ලැබීමෙන් හෝ අවමන් කරනු ලැබීමෙන් ආරක්ෂාව ලැබීමට ; සහ

(ඈ) නීති ආධාර නොමැතිවීම නිසා ළමයාට බලපාන අපරාධ නඩු කටයුතුවල දී ළමයාට සැලකිය යුතු අසාධාරණයක් විය හැකි අවස්ථාවල දී, රජයේ වියදමින් රජය විසින් සපයනු ලබන නීති ආධාර ලබාගැනීමට,

අයිතියක් ඇත්තේ ය.

(2) රාජ්‍ය අංශයේ හෝ පෞද්ගලික අංශයේ හෝ සමාජ සුභසාධන ආයතන, අධිකරණ, පරිපාලන බලධාරීන් හෝ ව්‍යවස්ථාදායක මණ්ඩල යන කවරක් හෝ විසින් ළමයින්ට අදාළ වන යම් කාරණයක් භාරගනු ලැබුවේ වුව ද, ඒ සියලු කාරණයකදීම ළමයාගේ උපරිම ශුභ සිද්ධියට ප්‍රමුඛස්ථානය දෙනු ලැබිය යුතු ය.

ලබාදෙන ප්‍රතිලාභවලට ප්‍රවේශවීමේ අයිතිය.

**6**. (1) සෑම පුරවැසියකුට ම—

(අ) ප්‍රසිද්ධ කටයුතුවලදී සෘජුවම හෝ යම් නියෝජිතයකු මාර්ගයෙන් ඒවාට සහභාගීවීමට ; සහ

(ආ) රජය විසින් මහජනතාවට සපයන සේවාවලට ප්‍රවේශවීමට,

අයිතිය සහ අවස්ථාව තිබිය යුතු ය.

(2) මේ වගන්තියේ කාර්ය සඳහා "ප්‍රසිද්ධ කටයුතුවල දී" යන යෙදුමට යම් ලිඛිත නීතියක් මගින් හෝ එය යටතේ යම් විශේෂිත අධිකාරියක් වෙත අනන්‍ය ලෙස පවරා ඇති යම් කටයුතු, ඇතුළත් නොවිය යුතු ය.

මේ පනත යටතේ පිළිගනු ලබන මානව අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීම පිළිබඳ අධිකරණ බලය මහාධිකරණය විසින් ක්‍රියාත්මක කළ යුතු බව.

**7**. (1) මේ පනතේ 2, 4, 5 සහ 6 වන වගන්ති යටතේ යම් තැනැත්තකුට හිමි මානව අයිතිවාසිකම්, විධායක ක්‍රියාවක් හෝ පරිපාලන ක්‍රියාවක් මගින් කඩකිරීම හෝ කඩකිරීමට අත්‍යාසන්නවීමට එරෙහිව යම් තැනැත්තකුට, මහාධිකරණය වෙත අමතනු ලබන පෙත්සමක් මාර්ගයෙන් ඉල්ලුම් කිරීමේ අයිතිය ඇති අතර, එම පෙත්සමේ අයැද ඇති පරිදි යම් සහනයක් හෝ පිහිටක් අයැද සිටීමේ අයිතිය ද ඔහු සතුව ඇත.

(2) (1) වන උපවගන්තියේ සඳහන් වගන්ති මගින් විධිවිධාන සලසා ඇති මානව අයිතිවාසිකම්වලින් යම් අයිතිවාසිකමක් කඩවී ඇති බවට හෝ කඩවීමට ආසන්න බවට චෝදනා කරන යම් තැනැත්තකුට, ඔහු විසින්ම හෝ ඔහු වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකු මාර්ගයෙන්, අවස්ථාවෝචිත පරිදි, උද්දේශිත කඩවීම හෝ අත්‍යාසන්න කඩවීම සිදු වී මාස තුනක් ඇතුළත (1) වන උපවගන්තිය යටතේ මහාධිකරණයේ අධිකරණ බලය ක්‍රියාත්මක කරවා ගැනීමට පිහිට පැතිය හැකි ය:

කෙසේ වුව ද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ හෝ IV වන පරිච්ඡේදයේ ප්‍රකාශ කොට පිළිගනු ලබන මූලික අයිතිවාසිකම් හෝ භාෂා අයිතිවාසිකම්වල විෂය සීමාව තුළට ඇතුලත් වන, යම් මානව අයිතිවාසිකමක් කඩකිරීම සම්බන්ධයෙන් හෝ කඩකිරීමට අත්‍යාසන්න වීම සම්බන්ධයෙන් විනිශ්චය කිරීම සඳහා, මහාධිකරණයේ අධිකරණ බලය ව්‍යාප්ත නොවිය යුතු ය.

(3) වෙනත් යම් නීතියක විධිවිධානවල පටහැනිව කුමක් සඳහන් වුව ද, මහාධිකරණය විසින් උචිත යයි සලකනු ලබන විටක, මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද පෙත්සමකට අදාළ නීති කෘත්‍ය යක කවර හෝ අවස්ථාවක දී, එම කාරණය පිළිබඳව පරීක්ෂා කොට වාර්තා කිරීම සඳහා එම කාරණය ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත යොමු කරනු ලැබිය හැකි අතර, තත්කාර්ය සඳහා අධිකරණය විසින් සඳහන් කරනු ලබන කාලසීමාවක් ඇතුළත මහාධිකරණය වෙත වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස එම කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටිය හැකි ය.

(4) (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද පෙත්සමක අයැද ඇති සහන ප්‍රදානය කිරීමේ හෝ අවස්ථානුගත කරුණු අනුව සාධාරණ සහ යුක්ති සහගත යයි අධිකරණය සළකන වෙනත් සහනයක් ප්‍රදානය කිරීමේ හෝ නියෝගයක් ලබාදීමේ බලය, මහාධිකරණය සතු ය.

(5) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ කාර්ය සඳහා "තැනැත්තකු" යන්නට ළමයකු ද ඇතුළත් වේ.

8. මේ පනතේ 7 වන වගන්තිය යටතේ ගොනු කරන ලද යම් පෙත්සමක් සම්බන්ධයෙන් මහාධිකරණය විසින් කරන ලද ආඥාවකින් අතෘප්තියට පත් යම් තැනැත්තකුට, එම ආඥාවට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනය කිරීමේ අයිතිය තිබිය යුතු ය.

ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනය කිරීමේ අයිතිය.

නියෝග.

**9**. (1) මේ පනතේ ප්‍රතිපත්ති සහ විධිවිධාන බලාත්මක කිරීමේ කාර්ය සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කල යුතු අතර, එය එසේ පළකරනු ලබන දින සිට හෝ එම නියෝගයේ සඳහන් පසු දිනයක සිට, ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මණින් පාර්ලිමේන්තුවේ අනුමතය සඳහා ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එම අනනුමතයේ දින සිට, එතෙක් ඒ යටතේ ඊට කලින් කරන ලද කිසිවකට අගතියක් නොමැතිව, පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

(4) යම් නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය.

**10**. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"ළමයා" යන්නෙන් වයස අවුරුදු දහඅටට අඩු තැනැත්තකු අදහස් වේ;

"මහාධිකරණය" යන්නෙන් ශ්‍රී ලංකා ජනරජයේ මහාධිකරණය අදහස් වේ; සහ

"ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව" යන්නෙන් 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත මගින් පිහිටුවන ලද, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව අදහස් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**11**. මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.